ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත (SA-82) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව ලෙජර් අංක 9151, 9152, 9153 හා 9160 යටතේ ඇතුළත් කර තිබුණු අයිතම කාණ්ඩ 15 ක අවසාන ශේෂයන්, 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ ඊට අනුරූප ආරම්භක ශේෂයන් සමඟ සැසඳීමේදී රු.3,807,620,445 වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු විගණනයේදී අනාවරණය නොවුණි.	2023 දෙසැම්බර් 31 දිනට භාන්ඩාගාර මුද්‍රිත (SA-82) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව ලෙජර් අංක 9151,9152,9153 හා 9160 යටතේ ඇතුලත් කර තිබූ අයිතම කාණ්ඩ 15ක 2023 වසරේ අවසාන ශේෂයන් 2024 වර්ෂයේ මූල්‍ය නොවන ප්‍රකාශන කට්ටලයේ ඊට අනුරූප ආරම්භක ශේෂය වෙනස් වීම සිදු වී ඇත්තේ භාණ්ඩ සමීක්ෂණය සිදු කරන ලද අවස්ථාවේ භාණ්ඩ වල වටිනාකම තක්සේරු කිරිමේදි ඇතැම් භාණ්ඩවල වටිනාකම් වෙනස් වීම මතයි. මෙම තත්වය හේතුවෙන් 2023 වසරේ අවසාන ශේෂයන් හා 2024 වර්ෂයේ ආරම්භක ශේෂයන් අතර වෙනස් වීමක් සිදු වී ඇත.මෙම වසරේ සිට එය නිවැරදි කිරිමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි.	ගිණුම් කටයුතු සඳහා පාදක කර ගන්නා මූලාශ්‍ර ලේඛන සහ අනෙකුත් වාර්තා නිසි පරිදි යාවත්කාලීන කළ යුතු අතර, ශේෂ වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය.
(ii)	භාණ්ඩාගාර මුද්‍රිත ශේෂ පිරික්සුම අනුව 9151, 9152 හා 9160 යන ලෙජර් අංක යටතේ 2024 වර්ෂයේ මිලදී ගෙන තිබුණු මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.64,820,518 ක් වුවද, භාණ්ඩාගාර මුද්‍රිත (SA-82) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව	භාණ්ඩාගාර මුද්‍රිත ශේෂ පිරික්සුම අනුව 9151, 9152 හා 9160 යන ලෙජර් අංක යටතේ 2024 වර්ෂයේ මිලදී ගෙන ඇති මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම වන රු 64,820,518ක් සහ භාණ්ඩාගාර මුද්‍රිත (SA-82) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව ඉහත ලෙජර් අංක යටතේ මිලදි	ගිණුම් කටයුතු සඳහා පාදක කර ගන්නා මූලාශ්‍ර ලේඛන සහ අනෙකුත් වාර්තා නිසි පරිදි යාවත්කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු අතර, ඊට

	ඉහත ලෙජර් අංක යටතේ මිලදී ගෙන තිබුණු මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.26,997,865 ක් වූයෙන් රු.37,822,653 ක වෙනසක් නිරීක්ෂණය විය.	ගෙන ඇති මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු 26,997,865 කි .එහිදි රු 37,822,653 වෙනසක් පැවතීමට හේතුව වන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල CIGAS පද්ධතිය වසර පුරාවට නිසි ලෙස යාවත්කාලින කර CIGAS WEB INTERFACE තුල නිසි ලෙස යාවත්කාලින කිරිම නොකිරිම මත මූල්‍ය නොවන වත්කම් වල වටිනාකමේ වෙනසක් ඇති වී අතර මෙම වර්ෂය තුලදි නිසි ලෙස යාවත් කාලින කර ගැනීම සිදු කර නැවත වරක් මෙවැනි වෙනස් වීම ඇති නොවීමට වග බලා ගන්නා බවට සහතික වේ.	අදාළ අභ්‍යන්තර පාලන ශක්තිමත් කළ යුතුය. අදාළ නිවැරදි කිරීම් කඩිනමින් සිදු කළ යුතුය.
(iii)	භාණ්ඩාගාර මුද්‍රිත (SA- 82) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ ප්‍රවාහන උපකරණ හා වෙනත් යන්ත්‍රෝපකරණ වත්කම් කාණ්ඩයේ ආරම්භක ශේෂවලට එකතු කිරීම් හා මිලදී ගැනීම්වල මුළු වටිනාකම රු.24,050,870 ක් වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කළ ශේෂ පිරික්සුම අනුව එහි වටිනාකම රු.22,321,158 ක් වූයෙන් රු.1,729,712 වෙනසක් නිරීක්ෂණය විය.	භාන්ඩාගාර මුද්‍රිත (SA -82) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ ලෙජර් අංක 9152 (ප්‍රවාහන උපකරණ හා වෙනත් යන්ත්‍රෝපකරණ) වත්කම් කාණ්ඩයේ ආරම්භක ශේෂවලට එකතු කිරිම් හා මිලදී ගැනීම්වල මුළු වටිනාකම රු.24,050,870 (රු 4,268,005+19,782,865) හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම අනුව වටිනාකම වන රු. 22,321,158 වන අතර එහි වෙනස වන රු.1,729,712 ට හේතු වී ඇත්තේ ද ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල CIGAS පද්ධතිය වසර පුරාවට නිසි ලෙස යාවත්කාලින කර CIGAS WEB INTERFACE තුල නිසි ලෙස යාවත්කාලින නොකිරිමයි. මෙ වසරේ සිට නිවැරදි ලෙස සකස් කිරිම සිදු කරනු ලබන බව කාරුණිකව දන්වමි.	ගිණුම් කටයුතු සඳහා පාදක කර ගන්නා මූලාශ්‍ර ලේඛන සහ අනෙකුත් වාර්තා නිසි පරිදි යාවත්කාලීන කළ යුතු අතර, නොසැසඳීම් සඳහා හේතු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය.
(iv)	භාණ්ඩාගාර මුද්‍රිත (SA-82) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ නොනිම් වැඩ (WIP) යටතේ ප්‍රවර්ථන වර්ෂයේ එකතු කිරීම් හා ඉවත් කිරීම් කිසිවක් සඳහන් කර නොතිබුණු නමුත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කළ ශේෂ පිරික්සුම අනුව එකතු කිරීම් හා ඉවත් කිරීම් ලෙස පිළිවෙලින් රු.4,275,000 ක් හා රු.1,490,000 ක් සඳහන් කර තිබුණු බව නිරීක්ෂණය විය.	ඇතැම් ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් වත්කම් වාර්තාව සැකසීමේදි නොනිමි වැඩ (WIP) එකතු කිරිම් ඉවත් කිරිම් ඇතුලත් කර නොමැතිව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට යවා ඇත. එම මාසවලම පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමෙහි එකතු කිරිම් හා ඉවත් කිරිම් නිවැරදි ලෙස ඇතුළත් කර ඇත . එබැවින් මෙම වෙනස නිර්මාණය වී ඇත . මෙම වාර්තා 02 අවස්ථා 02කදී දෙපාර්තමේන්තුව වෙත යොමු කරන	ගිණුම් කටයුතු සඳහා පාදක කර ගන්නා මූලාශ්‍ර ලේඛන සහ අනෙකුත් වාර්තා නිසි පරිදි යාවත්කාලීන කළ යුතු අතර, අදාළ නිවැරදි කිරීම් කඩිනමින් සිදු කළ යුතුය.

		බැවින් මෙම අඩුපාඩුව සිදුව ඇත. මේ වන විට එය හදුනාගෙන එකතු කිරීම් හා ඉවත් කිරීම් ඇතුලත් කර නිවැරදි කර ඇත. මින් ඉදිරියට එසේ නොවීමට කටයුතු කරමි.	
(v)	2024 මැයි 16 දිනැති රජය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන කරන ලද අංක SA/MFS/C1/C1/11/271 දරන ලිපියේ සඳහන් පරිදි තඹලගමුව හා කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රු.93,150,000 ක පිරිවැයකට තක්සේරු කරන ලද ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ (SA-82) ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	තඹලගමුව හා කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රු 93,150,000.00 ක පිරිවැයක තක්සේරු කරන ලද ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් 2025 වර්ෂයේ මාර්තු මස සහ 2025 වර්ෂයේ ඔක්තෝබර් මස ඇතුළත් කර ඇත.	කාල පරිච්ඡේදයට අදාළ වත්කම් නිසි පරිදි ගිණුම්ගත කර ඉදිරිපත් කළ යුතුවේ.
(vi)	2020 දෙසැම්බර් 31 දින සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදීගත් රු.74,000 ක් පිරිවැය වූ රාක්ක 05 ක් 2020 වර්ෂයේ සිට 2024 වර්ෂයේ දක්වා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ (SA-82) නොනිමි වැඩ (WIP) යටතේ දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.	2020 දෙසැම්බර් 31 දින සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදීගත් රු 74,000 ක් පිරිවැය වූ රාක්ක 05 ක් 2025 වර්ෂයේ මාර්තු මස CIGAS පද්ධතිය තුලට ඇතුලත් කර ඇත.	අදාළ වත්කම් නිසි පරිදි වර්ගීකරණය කොට මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කළ යුතු වේ.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 1.6.1 (i),(ii),හා (iii) ඡේදවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 දරන, 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධ මාර්ගෝපදේශ හා ආකෘති සංග්‍රහයේ 3.4 ඡේදය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට ඉතිරිවීම් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 05 ක් හෝ රු.10,000 යන දෙකෙන් කවර හෝ වැඩි මුදලට වඩා වැඩිවන විට එම වැඩිවීමට හේතු සාධාරණීකරනය කිරීමට අවශ්‍ය කරුණු ඇතුළත් කළ යුතු වුවද, ඉතිරි වී තිබුණු රු.30,553,347 ක ප්‍රතිපාදන සම්බන්ධයෙන් එවැනි කරුණු ඉදිරිපත් කිරීමක් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය	2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06 /2024 දරන 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරිම සම්බන්ධයෙන් මාර්ගොපදේශ හා ආකෘති සංග්‍රහයේ 3.4 ඡේදය ප්‍රකාරව 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරිවීම් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 05ක් හෝ රු.10,000යන දෙකෙන් කවර හෝ වැඩි මුදලට වඩා වැඩි වු රු 30,553.347 සම්බන්ධයෙන් අනු අංක 01 සිට 04 දක්වා විෂය හා වැය විස්තරය අනුව ඊට අදාළ හේතු පිළිතුර සමඟ ඉදිරිපත් කර ඇති බව.	චක්‍රලේඛය ප්‍රකාරව ඉතිරිවීම් සම්බන්ධයෙන් පැහැදිලි හේතු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂයට අදාළව 2025 වර්ෂයේදී ගෙවා තිබුණු රු.1,708,909 ක් පිරිවැය වූ බිල්පත් 26 ක වටිනාකම 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	තවද 02/189 දරන 990,056 ක අලුත් වැඩියා බිල්පත සඳහා 2024 වර්ෂයේ 271 ශීර්ෂය යටතේ ප්‍රතිපාදන ප්‍රමාණවත්ව නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස ඇතුළත් කර නැත. එසේම තවත් බිල්පත් 02 මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස ඇතුලත් කර නොතිබුණි.	බැරකම් ලෙස පවතින අදාළ සියළු බිල්පත් බැරකම් යටතේ ඇතුළත් කළ යුතු අතර, ඒ බව තහවුරු වන අභ්‍යන්තර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.

3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2019/20 මහ කන්නයේ සිට 2022 වර්ෂ වෙනුවෙන් වී මිලදී ගැනීමේ කඩිනම් වැඩ පිළිවෙල යටතේ කන්තලේ ප්‍රාදේශීය ලෙකම් කොට්ඨාශයේ සහල් මෝල් හිමිකරුවන් 04 දෙනෙකුගෙන්ද, පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහල් මොල් හිමිකරුවන් 02 නෙකුගෙන් සහ සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහල් මෝල් හිමියන් 02 නෙකුගෙන්ද ලෙස මෝල් හිමියන් 08 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතු වටිනාකම රු.49,770,694 ක් මුදල් වර්ෂ 04 ක කාලයක් ඉක්ම ගියද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අයකරගෙන නොතිබුණි.	කන්තලේ ප්‍රාදේශිය ලේකම් වරයා විසින් කිහිපවරක් දැනුවත් කිරිම් සිදු කර ඇතත් මෙතෙක් කන්තලේ වී මෝල් හිමියන් 04 දෙනෙකු විසින් රජයට අය විය යුතු මුදල් මෙතෙක් ගෙවා නැත. නිතිමය පිවයවරක් ලෙස කන්තලේ පොලිසියට පැමිණිල්ලක් යොමු කර ඇති අතර මේ සම්බන්ධව කනත්ලේ ප්‍රාදේශිය ලේකම් විසින් නිතිමය කටයුතු සිදු කර ගෙන යනු ලබයි.පදවි ශ්‍රිපුර සහල් මෝල් හිමියන් දෙදෙනාගෙන් එක් අයකු මේ වන විට සියලු මුදල් ගෙවා ඇති අතර අනෙකාට නිතිමය කටයුතු සිදු කිරිම සඳහා කටයුතු කර ඇත. තවද සේරුවිල මොල් හිමියන් දෙදෙනාගෙන් එක් අයකු හට නිතිමය පියවර ගැනීම සඳහා ජොෂ්ඨ පොලිස් අධිකාරි, පොලිස් අධිකාරි කාර්යාලය, කන්තලේ වෙතද අනෙක් මොල් හිමියා හට මේ වෙන විට කොළඹ අපරාධ විමර්ශණ ඒකකය වෙත නීතිමය පියවර ගන්නා ලෙස ලිපි යොමු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	වී මිලදී ගෙන සහල් නිකුත් කිරීමේ සමස්ථ ක්‍රියාවලියම විධිමත් පරික්ෂණයකට ලක් කර අදාළ පාර්ශව වෙත විධිමත් පියවර ගත යුතු අතර කඩිනම්ව ක්‍රියාමාර්ග ගෙන අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2024 වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලසීමාව තුළ කුච්චවෙලී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලියාපදිංචි ගර්භනී මව්වරුන් 78 දෙනෙකු විසින් රු.351,000 පිරිවැය වූ පෝෂණ දීමනාව ලබාගෙන නොතිබුණි.	ඇතැම් මවුවරුන් විසින් ගර්භණී කාලසීමාව තුල කොට්ඨාසයෙන් බැහැරව වෙනත් ප්‍රදේශ කරා යනු ලබන අතර එවන් අවස්ථාවන්හිදී තමාට හිමි පෝෂණ මුද්දරපත් අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මාරු කර දෙන ලෙස ඉල්ලීම් කිරීමකින් තොරව කොට්ඨාසයෙන් බැහැර වීම නිසා සහ ඇතැම් මව්වරුන් මුද්දරපත් අස්ථාන ගත කර ගැනිම් නිසා සහ මෙම පෝෂණ මල්ල ලබා ගැනිම සඳහා දැනුවත් වීම කලද මෙම පෝෂණ මල්ල ලබා නොගැනීම හේතුවෙන් මෙම දීමනාව ඉතිරිවීම සඳහා හේතු වී ඇත.	නිසි වැඩපිළිවෙලක් සකස් කොට විධිමත් අධීක්ෂණයක් යටතේ ප්‍රතිලාභීන් වෙත ප්‍රතිලාභ ලබා දීම තහවුරු කළ යුතුය.

(ඇ)	ත්‍රිකුණාමලය කලාප අධ්‍යාපන කාර්යාලයේ ඉංජිනේරුවරයා විසින් පුල්මුඩේ මහා විද්‍යාලයේ ශ්‍රවණාගාර ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.4,287,987ක් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර තිබුණු අතර එම ඇස්තමේන්තුවේ අයිතම 09 ක ඇස්තමේන්තුගත අගයන් සියයට 11 සිට සියයට 397 දක්වා වැඩි පිරිවැය විචලනයක් සහිතව සකස් කර අවසන් බිල්පත ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතිය කුච්චවෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කොට තිබුණි.	ත්‍රිකුණාමළය කළාප අධ්‍යාපන කාර්යාලයේ ඉංජිනේරුවරයා විසින් පුල්මුඩේ මහා විද්‍යාලයේ ශ්‍රවණාගාරය ඉදිකිරිම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල වන රු. 4,287,987 ක මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර තිබූ අතර ත්‍රිකුණාමළය කළාප අධ්‍යාපන කාර්යාලයේ ඉංජිනේරුවරයාගේ විචලනය වාර්තාව (variation report) අනුව මෙම බිල් පත් ගෙවූ බව කාරුණිකව දන්වා සිටිමි.	නිවැරදිව අවශ්‍යතා හඳුනාගෙන විධිමත් අධ්‍යනයකින් පසුව හැකිතාක් දුරට ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුය.

3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සහතික කිරිම සඳහා වාර්ෂිකව බලය විමධ්‍යගත කිරිම හා ස්ථාවර නියෝග නිකුත් කර ඇති අතර ආයතනයේ එක් එක් ක්‍රියාවලින්ට අදාළව ක්‍රියාත්මක කල යුතු අභ්‍යන්තර පාලනයක් ඇතුලත් ලේඛණයක් ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිකුත් කර ඇති අතර එම පාලනයන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව වාර්ෂිකව සමාලෝචනය කර මෙම 2025 වර්ෂයේ සිට විගණකාධිපති වෙත වාර්තාවක් ඉදිරිපත් කිරිමට බලාපොරොත්තු වේ.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරික්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	මුදල් රෙගුලාසි 104(4) වගන්තිය	-	KB-957 දරණ මොන්ටේරෝ ජීප් රථය 2023 ජනවාරි 28 දිනදී දරුණු අනතුරට ලක්ව රියදුරුද මියගිය අතර ඒ පිළිබඳ පරීක්ෂණයෙන් පසු අලාභ හානිය සිදු වූ දින සිට තුන් මසක් ඇතුලත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	අංක EPKB – 0957 දරන මොන්ටෙරෝ ජීප් රථය 2023.01.28 දින දරුණු අනතුරකට ලක් වී රියදුරු මිය ගිය අතර ඒ සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණ මේ වන විට සිදු කරමින් පවතී. අධිකරණ කටයුත්ත ද මේ වන විට අවසන් වී නොමැත.	මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.
(ආ)	චක්‍රලේඛ අංක 09/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (iv) ඡේදය	4,581,676	අතිකාල හා නිවාඩු දින ගෙවීම් කිරීමේදී ඇඟිලි සළකුණු යන්ත්‍ර මඟින් තහවුරු කිරීම අත්‍යවශ්‍ය වුවත් මොරවැව, පදවි ශ්‍රී පුර, ගෝමරන්කඩවල, සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරීන් විසින් එලෙස කටයුතු නොකර සමාලෝචිත වර්ෂය තුලදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලබා ගෙන තිබුණි.	අතිකාල හා නිවාඩු දින ගෙවිම් කිරිමේදි ඇගිල් සළකුනු යන්ත්‍ර මගින් සහතික කිරිම සිදු කරනු ලබන අතරම ඇගිලි සලකුණු යන්ත්‍ර අක්‍රිය පවතින කාල සීමාවන් වලදි මාණ්ඩලික නිලධාරියකුගේ අධික්ෂණය යටතේ පැමිණීම හා පිටවීමේ ලේඛණය පදනම් කරගෙන ගෙවීම් කටයුතු සිදු කරනු ලබයි. මේ වන විට ඇගිලි සලකුනු යන්ත්‍රය පදනම් කර ගෙන අතිකාල හා නිවාඩු දින ගෙවිම් සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි.	අංක 09/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බවත් එසේ සිදු කර නොතිබීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව වෙත පියවර ගැනීමත් කළ යුතුය.

(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 3.1 ඡේදය	- සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 2500 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකළ යුතු වුවද, ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කැබ්රථ 2ක් සඳහා පිළිවෙලින් 2013 හා 2018 වර්ෂවල සිට 2025 පෙබරවාරි 14 විගණන දින දක්වා ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.	මේ වන විට නගර හා කඩවත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අංක 251-3541 හා WP PA-3837යන දරණ කැබ් රථ 02ම 2025 වර්ෂයේ විට ඉන්ධන පරික්ෂාවන් සිදු කර ඇත.	අදාළ චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව කඩිනමින් කළ යුතුය.

3.6 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු තැන්පත් සැසඳුම් ප්‍රකාශය අනුව වසර 02 ත් 05 අතර නිරවුල් නොකරන ලද රු.1,203,011 ක තැන්පතු ශේෂයක් පවතින බව නිරීක්ෂණය විය.	2024 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබු තැන්පත් සැසඳුම් ප්‍රකාශය අනුව වසර 02ත් 05ත් අතර නිරවුල් නොකරන ලද රු.1,203,011 තැන්පතු ශේෂ පවතී.	මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත්ව කටයුතු කර අදාළ තැන්පතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට තැන්පත් ලෙජරය අනුව කොන්ත්‍රාත් සඳහා රැඳවුම් මුදල් තුළ වසර 02 ඉක්මවූ රු.204,323 ක තැන්පත් ශේෂ 07 ක් 2024 වර්ෂයේ සැසඳුම් ප්‍රකාශනයේ	2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් ලෙජරය අනුව කොන්ත්‍රාත් සඳහා රැඳවුම් මුදල් තුල වසර 02ක් ඉක්මවූ රු 204,323 ක තැන්පත් ශේෂ 07ක් 2024 වර්ෂයේ සැසඳුම්	කාල විශ්ලේෂණයට අදාළ තොරතුරු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

තැන්පත් කාල විශ්ලේෂණයට නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	ප්‍රකාශයේ තැන්පත් කාළ විශ්ලේෂණයේ වසර 02- වසර 05 තුල ඇතුලත් කල යුතු වුවද 2024 වර්ෂයේ සැසඳුම් ප්‍රකාශනයට ඇතුලත් කිරිමේදි වැරදීමකින් නැවත වරක් කාළ විශ්ලේෂණයේ වසර වසර 01- වසර 02 ලෙස ඇතුලත් කර ඇත. පරිගණක ගත කිරිමේදි ඇතිවූ වරදකින් නිසාවෙන් එසේ සිදු වී ඇති අතර නැවත වරක් මෙසේ නොවීමට කටයුතු කරමි.	

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලැසුම් කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
(අ)	ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ගිණුම් චක්‍රලේඛ අංක 02/2018 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 වන ඡේදය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහජනයා වෙත සපයන සේවා ප්‍රමුඛතා ගත කොට ප්‍රධාන සේවාවන් 5 කට අදාළව ප්‍රශස්ත ඉලක්කයන් තීරණය කර එම ඉලක්ක පිළිබඳ වාර්තාවක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රශස්ත ඉලක්කයන් සාරාංශගත කොට සකස් කරන ලද වාර්තාවක් විගණකාධිපතිටද පිටපත් සහිතව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත සෑම වර්ෂයකම ජනවාරි 15 වන දිනට පෙර ඉදිරිපත් කල යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2024 වර්ෂයට අදාළව එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රශස්ත ඉලක්කයන් සාරාංශගත කොට සකස් කරන ලද වාර්තාව මේ වන විට සකස් කරමින් පවතින අතර මේ 2025 වර්ෂයේ එය සකස් කිරිමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බවත්, එසේ කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව වෙත විධිමත් පියවර ගැනීමත් කළ යුතුය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලබන අඩු ආදායම් ලාභීන් හා නැවත පදිංචි වූ අවතැන් පවුල් වෙනුවෙන් 2021 සහ 2023 වර්ෂ වල කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් හඳුනාගෙන ලබාදුන් රු.600,000 නිවාස 04 ක් සහ රු.100,000 ක නිවාස 15 ක ඉදිකිරීම් සම්පූර්ණ වී නොතිබුණි.	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ මෙම නිවාස වැඩ සටහනේ විගණනය මගින් පෙන්වා දෙනු ලබන මෙම ගැටලුකාරි තත්වය පිළිබඳව මීට පෙර අවස්ථා ගණනාවක දි ප්‍රාදේශිය විගණන කමිටුවේ දි හා දිස්ත්‍රික් විගණන කමිටුවේ දි නිරන්තරයන් කරුණු ඉදිරිපත් කරනු ලැබූ බවත්, ඒ සඳහා ස්ථිරසාර විසඳුමක් නොලැබී ඇති බවත් ,දක්වා ඇති පරිදි එම නිවාස ඒකකවල වැඩ අවසන් කිරිමට නොහැකි විමට සත්‍ය වශයෙන්ම හේතු වුයේ ද ඇස්තමේන්තු සකස් කළ කාල සිමාව වු 2019 වර්ෂයට සාපේක්ෂව ප්‍රතිපාදන ලැබී කාර්ය ආරම්භ කිරිම සඳහා ගත වු කාලය අතරතුර එක්වරම රට තුළ ඇති වු අයහපත් ආර්ථික තත්වය මත ගොඩනැගිලි ද්‍රව්‍යයන්හි ඇති වන ලද අධික මිල ඉහළ යාමයි.	ව්‍යාපෘති ක්‍රියාත්මක කළ ආයතන සම්බන්ධීකරණය කර නිසි අනුමැතියක් මත අදාළ කටයුතු කාර්යක්ෂමව නිම කිරීමට වැඩපිළිවෙලක් යෙදිය යුතුය.

4.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ග්‍රාමීය මාර්ග හා යටිතල පහසුකම් ව්‍යාපෘතිය 2021 වර්ෂය යටතේ (RRDP) මාර්ග 69ක් ඉදිකිරීම සඳහා එකතුව රුපියල් මිලියන 99ක ප්‍රතිපාදන වෙන්කර වෙරුගල් සහ මුතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබාදී තිබූ අතර, ඉදිකිරීම් සඳහා එකතුව රුපියල් මිලියන 21.98ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කර තිබූ නමුත් ප්‍රවර්ථන වර්ෂය වන විටදී මෙම කාර්යයන් සියල්ල අඛණ්ඩව ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි.	2021 වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ ක්‍රියාත්මක වන ග්‍රාමීය මාර්ග 69ක් ඇත. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2021 නොවැම්බර් මාසයේදී රුපියල් මිලියන 99.00 ක මුදලක් වෙන් කරන ලද අතර, එම වසර අවසන් වන විට ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට උපදෙස් ලබා දී ඇත.	අදාළ සම්බන්ධිත ආයතන සමඟ සම්බන්ධීකරණය වී විශේෂ අවධානයක් යොමු කොට සුදුසු පරිදි ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතුය.

4.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කන්තලේ පොලිසිය ඉදිරිපිට තනි පුද්ගල රජයේ පේලි නිවාසය ඉතා පැරණි බැවින් හා පදිංචියට සුදුසු තත්වයේ නොපවතින බැවින් කඩා ඉවත් කිරීම සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ඉංජිනේරුගේ නිර්දේශය ලැබී තිබෙන බව අතිරේක දිසාපති හා අතිරේක දිස්ත්‍රික් ලේකම්ගේ අංක GAT/EST/DSDIV/MA06/11(Kan) හා 2022 මාර්තු 14 දිනැති ලිපිය මගින් දන්වා තිබුණි. විගණිත දින වූ 2024 ඔක්තෝබර් 22 දින වනවිට එම ගොඩනැගිල්ලේ නිවාස 07 කින් නිවාස 05 ක පදිංචියව සිටින අතර අදාල නිවාසයන්හි පදිංචිය අනාරක්ෂිතව පවතින බව නිරීක්ෂණය විය ඉහත ලිපිය අනුව කඩා ඉවත් කිරීමට නිර්දේශය ලැබී වසර 02 මාස 07 ක් ඉක්මවා තිබුණද අදාල ඉවත් කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.	මුදල් අමාත්‍යාංශයේ2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍ර ලේඛ අංක 3/2022 හි රාජ්‍ය වියදම් පාලනය කිරීම සියළුම රාජ්‍ය ආයතන විසින් දැඩිව අනුගමනය කල යුතු බවට උපදෙස් නිකුත් කරන ලදී. එබැවින්, එකී නිවාසය කඩා ඉවත් කර ගැනීම තාවකාලිකව අත්හිටුවන ලදී. ඉදිරියේදී ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමෙන් පසු එම නිවාසය කඩා ඉවත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිදු කරන බවත් ,කොට්ඨාශයේ වෙනත් රාජ්‍ය ආයතන වල නියුතු නේවාසිකයන් හට නවාතැන් පහසුකම් නොමැතිකම හේතුවෙන් ඇතැම් අවස්ථාවලදි මෙම නිවාසයන් හි පදිංචි වීමට අවසර ඉල්ලා සිටින බැවින් එම නිවාසයන් පදිංචියට නුසුදුසු තත්වයේ පැවතියද එහිදී යම් අනතුරක් වුවහොත් සියළු වගකීම ඔවුන් විසින් ම භාර ගන්නා බවට වූ එකඟතාවය හා ඔවුන්ගේ ඉල්ලීම මත එම නිවාසයන්හි පදිංචිය සඳහා ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	පවතින අවධානම් තත්ත්වය සැලකිල්ලට ගෙන ජීවිත හා දේපළ ආරක්ෂා කර ගැනීමේ වැඩපිළිවෙලක් යෙදිය යුතුය.
(ආ)	ප්‍රාදේශීය ලේකම් නිලනිවාස 02 ද ඇතුළත්ව නිල නිවාස 07ක් සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත්ව පැවතියද නිල නිවාස 02 ක පමණක් පදිංචිව සිටින බව නිරීක්ෂණය වූ අතර එම පදිංචිව සිටින නිල නිවාස 02 ද අළුත්වැඩියා කලයුතු තත්ත්වයේ පවතින බැවින් පවත්නා වත්කම්වල ප්‍රශස්ථ උපයෝජනය ලබා ගත නොහැකි මට්ටමක පවතී. ඒ අනුව පැරණි ප්‍රාදේශීය ලේකම් නිලනිවස, සෝමපුර සංචාරක බංගලාව සහ වසර 42ක් ඉක්මවා ඇති පොදු නිලනිවාස 05ම අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි.	අදාළ නිල නිවාස අලුත්වැඩියා කිරිම සඳහා අවශ්‍ය 2025 වර්ෂයේ ප්‍රතිපාදන වලින් මෙම අලුත්වැඩියා කටයුතු සිදු කර අවසන් කරන බවට කාරුණිකව දන්වා සිටිමි.	වත්කම්වල පැවැත්ම හා ආරක්ෂාව සඳහා තිරසාර වැඩපිළිවෙලක් සකසා කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.

(ඇ)	සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් උපලේඛනගත නොවන අනෙකුත් නිලනිවාස 05 හා සෝමපුර සංචාරක බංගලාවේ ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු නොවන අතර එම ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරා ගැනීම මේ වන විටත් සිදුකර නොතිබුණි.	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමඟ සම්බන්ධ වී 2025 වර්ෂයේදි එම නිල නිවාස මෙම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කිරිම සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි.	ගොඩනැගිලිවල අයිතිය සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

4.5 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අනතුරට ලක්වූ ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් KB-0957 දරණ ජීප් රථය නැවත යතා තත්වයට පත්කිරීම වෙනුවෙන් වැයවූ රු.2,124,270 ක අලාභය රක්ෂණ ආයතනය මගින් හානි පූරණය කරගැනීමට නොහැකිවීම තුල රජයට එම වටිනාකමින් අලාභයක් සිදුවී පැවතුණි. තවද මරණයට පත් රියදුරාගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවට අනුව සිදුවී ඇති තුවාලවල ස්වභාවයෙන් අනාවරණය වනුයේ අනතුරට ලක්වන විට රථය පදවා ඇත්තේ රියදුරු නොවන බවයි.	අනතුරට ලක් වූ අංක EP KB – 0957 දරන මෝන්ටේරෝ ජීප් රථය නැවත යථා තත්ත්වයට පත් කිරිම වෙනුවෙන් රු.2,124,270 ක් වැයකර ඇති අතර අනතුර සිදු වූ අවස්ථාවේ රියදුරු බීමත්ව රිය පදවා ඇති බවට අධීක්ෂණ වෛද්‍ය වාර්තාව අනුව අනාවරණය වීම හේතුවෙන් රක්ෂණ ආයතනය මඟින් හානි පූර්ණය කර ගැනීමට නොහැකිව රිය අනතුර සිදුවන අවස්ථාවේදී රියදුරුට සිදුවී ඇති තුවාල අනුව රිය පදවා ඇත්තේ සුමිත් ජයතිලක වන රියදුරු නොවන බව අධිකරණ වෛද්‍ය නිලධාරිගේ මතය වී ඇති බැවින් මේ පිළිබඳව පොලිස් විමර්ශන තව දුරටත් පැවැත්වේ. අධිකරණ කටයුත්ත ද තවදුරටත් පැවැත්වෙන බැවින් පොලිස් විමර්ශන අවසන් වීමෙන් හා පරීක්ෂණය ඒ සම්බන්ධයෙන් අධිකරණය මඟින් ලබාදෙන තීන්දුව අනුව ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.	පසු විපරම් කටයුතු නිසි පරිදි සිදු කර කාලීනව කටයුතු කළ යුතු අතර මෙවැනි තත්ත්වයන් මඟ හරවා ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.

(ආ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 12 ක් සම්බන්ධව රු.5,678,948 ක වටිනාකමින් යුතු අලාභ හානි වෙනුවෙන් 1999 වර්ෂයේ සිට 2024 දක්වා වසර 25 ක් ගතවන තුරුත් සිදුවූ වාහන අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු අවසන් කොට නොතිබුණි.	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 12 ට අදාළව පරීක්ෂණ කටයුතු අවසන් වී ඇති සහ පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතින වාහන සම්බන්ධව වාර්තමාන තත්වය වාර්තා කර ඇත.	අදාළ කටයුතු කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය පියවර ගැනිමත් කාලිනව පරීක්ෂණ කටයුතු සිදු නොකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශව වෙත පියවර ගැනීමත් කළ යුතුය.

4.6 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ග්‍රාම නිලධාරී ලෙස සේවයේ නියුතුව සිටි නිලධාරියෙකු 2018 ජූලි 09 දින සිට වැඩ තහනමට ලක්ව පසුව අනිවාර්ය විශ්‍රාම ගන්වා ඇති අතර ඔහු රාජ්‍ය සේවයේ යෙදී සිටියදී ලබා ගෙන තිබූ ආපදා ණයවලින් රජයට ගෙවිය යුතු ණය ශේෂය රු.233,641 ක් විය. විගණිත දිනය වූ 2024 නොවැම්බර් 13 දින වනවිට වසර 06 මාස 04 ක කාලයක් ඉක්ම වුවද මෙම ණය ශේෂය අයකර ගෙන නොතිබුණි.	මෙම කාර්යාලයේ සේවය කරමින් සිටියදී විනය ක්‍රියාමාර්ගයක් හේතුවෙන් අනිවාර්ය විශ්‍රාම ගන්වා සිටින ග්‍රාම නිලධාරී එම්.ඒ.එම්.හාරික් මයා සේවයේ යෙදී සිටියදී ලබාගත් ආපදා ණය මුදල් වෙනුවෙන් ඔහු විසින් විටෙන් විට මෙම කාර්යාලයට මුදල් ගෙවා ඇති අතර, තවත් රු.233,641/= ක මුදලක් රජයට ගෙවීමට ඇත. කෙසේ වෙතත් ඔහු ගෙවිය යුතු මුලු ණය මුදලම ඔහුගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් අනිවාර්යයෙන් අඩුකිරීමට සටහන් කර ඇති අතර, මෙම විනය නියෝගයට එරෙහිව හාරික් මයා විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය ප්‍රතික්ෂේප කිරීමෙන් පසු විශ්‍රාම ගැන්වීම සඳහා අනුමැතිය පිණිස ඉදිරිපත් කර ඇතත් මේ දක්වා එම විශ්‍රාම ගැන්වීම අනුමත කර නොමැත. විශ්‍රාම ගැන්වීම අනුමත කරවා ගැනීම සඳහා විශ්‍රාම ගැනීමට අදාළ කටයුතු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත.	විධිමත් පරිදි කටයුතු කර හිඟ ණය ශේෂ වහා නිරවුල් කර ගැනීමට පියවර ගත යුතුය.

(ආ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් සමාලෝචන වර්ෂය දක්වා එකතුව රු. 524,931,349 ක් වටිනා දිගුකාලීන ඉඩම් සහ ගොඩනැගිලි බදු කුලී ආදායම් අයකර ගෙන නොතිබුණි.	දැනට 2025 .04.30 වන විට රු 11,345,390.00 ක මුදලක් දිගුකාලින ඉඩම් සහ ගොඩනැගිලි බදු කුලි ආයදාම ලෙස අය කර ගෙන ඇති අතර ඉතිරි මුදල්ද අය කර ගැනිමට කටයුතු කරමින් සිටින බව කාරුණිකව දන්වා සිටිමි.	කාලීනව සහ ආදායම් අය නොකිරීම අදාළ නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමත්, අදාළ හිඟ ආදායම් වහාම අයකර ගැනීමටත් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් සමාලෝචන වර්ෂය දක්වා එකතුව රු.868,636 ක කෙටිකාලීන ඉඩම් සහ කෙටිකාලීන බදු කුලී ආදායම් අය නොකර හිඟහිටිව පැවති අතර මෙම හිඟහිටි මුදල අයකර ගැනීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි.	දැනට 2025 .04.30 වන විට රු 53,600.00 ක මුදලක් කෙටිකාලින ඉඩම් සහ කෙටිකාලින බදු කුලි ආදායම ලෙස අය කර ගෙන ඇති අතර ඉතිරි මුදල් ද අය කර ගැනිමට කටයුතු කරමින් සිටින බව කාරුණිකව දන්වා සිටිමි.	-එම-
(ඈ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු.3,259,878 ක් වූ රජයේ නිලධාරීන් සඳහා ලබාදුන් අත්තිකාරම් වෙනුවෙන් දිගුකාලයක සිට අයකර නොගත් හිඟහිටි ණය ශේෂයන් පවතින බව නිරීක්ෂණය විය.	ත්‍රිකුණාමළය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිලධරින් සඳහා ලබා දුන් අත්තිකාරම් වෙනුවෙන් දිගු කලක සිට අය කර ගැනීමට ඇති ණය ශේෂයන් මේ වන විට අය කර ගෙන ඇති අතර අනෙකුත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලින් ඇතැම් ප්‍රාදේශිය ලේකම් කාර්යාල මේ වන විට අය කර ගැනීමට ඇති ශේෂයන් අය කර ගෙන ඇති අතර තව දුරටත් හිග හිටි ණය ශේෂයන් අය කර ගැනිමට ඇති ප්‍රාදේශිය කාර්යාලවලින් ඊට අදාළ කටයුතු සිදු කර ගෙන යන බවට කාරුණිකව දන්වා සිටිමි.	හිඟ හිටි ණය ශේෂ අය කිරීමට කාලීනව පියවර නොගත් නිලධාරීන්ට පියවර ගැනීමටත්, හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමටත් පියවර ගත යුතුය.
(ඉ)	ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ සේවය කළ නිලධාරිනියක් විසින් ව්‍යාජ විභාග ප්‍රතිඵල ඉදිරිපත් කර පත්වීම ලබාගෙන 2015 සැප්තැම්බර් 15 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් දීමනා වශයෙන් රු.3,305,197 ක් ලබාගෙන තිබුණි. ඊට අමතරව ලබාගෙන තිබූ ආපදා ණයවල 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.205,650 ක් වූ අතර 2015 ඔක්තෝබර් 14 දින සිට 2016 පෙබරවාරි 25 දින දක්වා සම්පූර්ණ වැටුප් සහිතව ප්‍රසූත නිවාඩු හා 2019 අගෝස්තු	(i) විභාග ප්‍රතිඵල ව්‍යාජ බව සනාථ වීමෙන් පසුව ඇයගේ සේවය අත්හිටුවා ඇත. (ii) ආපදා ණය ලෙස රජයට අය විය යුතු රු.205,650.00 ක මුදල ඇයගේ ඇපකරු වෙතින් වාරික වශයෙන් අයකර ගනු ලැබේ. (iii) 2015-2021 දක්වා කාලය තුල පුද්ගලික ලිපි ගොනු සම්බන්ධව කටයුතු කළ නිලධාරීන්ගෙන් අදාල ප්‍රමාදයට හේතු විමසා ඇත.	අදාළ කටයුතු කාර්යක්ෂමව සිදු කොට ඊට අදාළව වගකිව යුතු පාර්ශවයන් හට නිතිමය පියවර ගැනීමට වහාම ක්‍රියා කළ යුතු අතර රජයට සිදු වූ අලාභය පියවා ගැනීමද වහාම සිදු කළ යුතුය.

	27 දින සිට 2019 සැප්තැම්බර් 05 දින දක්වා දින 10 ක් දිවයිනෙන් බැහැර නිවාඩුද ලබාගෙන තිබුණ බව නිරීක්ෂණය විය.	(iv) වැටුප් හා දීමනා ලෙස ගෙවා ඇති රු.3,305,197 ක මුදල 2024.05.21 දිනට ප්‍රථම රජයට ගෙවන ලෙස නිලධාරීනියට දන්වා ඇත.	
(ඊ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 කට අදාළව ක්‍රියාත්මක වන සමෘද්ධි බැංකු 22 අදාළව 2024 දෙසැම්බර් 31 වන විටත් අයකර නොගෙන පවතින හිඟ ශේෂය රු.209,472,396 ක් වේ.	දැනට ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 කට අදාළව ක්‍රියාත්මක වන සමෘද්ධි බැංකු 22 අදාළව අය කර 2025.04.30 වන විට රු 11,025,337.78 අය කර ගෙන ඇති අතර ඉතිරි මුදල් අය කිරිමට කටයුතු සිදු කරමින් සිටින බව වැඩි දුරටත් කාරුණිකව දන්වමි.	හිඟ ණය කාලීනව අය නොකළ නිලධාරින්ට පියවර ගැනීමත්, අදාළ හිඟ ආදායම් වහාම අයකර ගැනීමටත් ක්‍රියාමාර්ග ගත යුතුය.

5. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාර ඉලක්කයන් පිළිබඳ නිලධාරින් ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නොතිබුණු අතර තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීම සිදුවී නොමැති නිසා සමාලෝචිත වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම පිළිබඳ ඇගයීමක් සිදු කර නොතිබුණි.	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අදාළවන පරිදි තිරසාර සංවර්ධන ඉලක්කයන් සඳහා අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු හා වෙනත් පාර්ශව මගින් දිස්ත්‍රික්කයට ලැබෙන අරමුදල් අනුව අදාළ තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ක්‍රියාත්මක කරනු ලැබේ.	තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීමට හා ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් හඳුන්වාදිය යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජ්‍යේෂ්ඨ මට්ටමට අයත් නිලධාරි තනතුරු පුරප්පාඩු 17 ක්ද තෘතික මට්ටමට අයත් නිලධාරි තනතුරු පුරප්පාඩු 21 ක්ද, ද්විතියික මට්ටමට අයත් නිලධාරි තනතුරු 56 ක්ද, ප්‍රාථමික මට්ටමට අයත් නිලධාරි තනතුරු 39 ක්ද, වශයෙන් මුළු පුරප්පාඩු ප්‍රමාණය 133 ක්ව පැවතුණි.	අදාල පුරප්පාඩු සම්බන්ධව පිළිබඳ විස්තර අමාත්‍යාංශය වෙත දැනුවත් කර ඇත.	කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අවශ්‍යම තනතුරු පුරප්පාඩු පමණක් පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

(ආ)	සමාලෝචන වර්ෂය තුළදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවා කාලය වර්ෂ 05ක් ඉක්මවා සිටින නිලධාරීන් 455 දෙනෙකු සම්බන්ධයෙන් ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර නොතිබුණ අතර, එම නිසා ස්ථාන මාරු අපේක්ෂාවෙන් සිටින නිලධාරීන්ට අවස්ථාව අහිමි වී තිබුණි.	2025 වර්ෂය තුළ මෙම තත්ත්වය මහ හැර ගැනීම සඳහා ස්ථාන මාරු මණ්ඩලයක් පත් කර කටයුතු සිදු කරන බවත්, මැතිවරණ දෙකක් පැමිණීම නිසා ස්ථාන මාරු කමිටුවේ කාර්යයන් ප්‍රමාද විය. 2025 ජූනි මස සිට මෙම තත්ත්වය මහ හැර ගැනීමට ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.	2001 අගෝස්තු 22 දිනැති 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.